# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1798/21 – 2013 පෙබරවාරි 19 වැනි අඟහරුවාදා – 2013.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2012 අංක 60 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/2000/පීසී/348.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: හාප/සං/2/ඉඅ/57.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 07 වැනි දින,
අංක 1200/6,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, හාරිස්පත්තුව.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව, සුළු කොට්ඨාසයේ, හිරියලගම්මන ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද පී.පී. මහ 5970 අංක හා 2009.01.21 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0642 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අංක 01 – ගමවෙලකුඹුර ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0642 ක් පමණ**

උතුරට: පාර සහ එච්. යූ. කරුණාරත්න හිමිකම් කියන පොතුවෙල කුඹුරේ වත්ත; නැගෙනහිරට: එච්. යූ. කරුණාරත්න හිමිකම් කියන පොතුවෙල කුඹුරේවත්ත සහ පාර; දකුණට: පාර සහ මාර්ග (මා.සං.අ.); බටහිරට: මාර්ග (මා.සං.අ.) සහ පාර.

03 - 354

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 163/3 හා 1975.05.12 වැනි දින දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 1975 අංක 180 හා 1975.05.12 වැනි දින දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මු.පි.මහ. 1990 හි කැබලි අංක 06 හි පමණක් භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය


*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 163/3 හා 1975.05.12 වැනි දින දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 1975 අංක 180 හා 1975.05.12 වැනි දින දරන ආඥාවේ කැබලි අංක 06 පමණක් මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන් ,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 03/ජේ/75/එල්/102/වීජී.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මධ්‍ය/යනු/සං/ඉ/1/එල්ඩී/එෆ්/587.
2013 පෙබරවාරි මස 05 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟපළාත කෝරළේ රණවන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මහ 1990 සහ 1980.09.21 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 06 ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් අක්. 02, රූඩ්.01, පර්. 39 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 04; නැගෙනහිරට: මෙම පිඹුරේ කැබලි අංක 04, මු.පි.මහ 1182 හි කැබලි අංක 01 හා මෙම පිඹුරේ කැබලි අංක 07; දකුණට: මු.පි.මහ 1182 හි කැබලි අංක 01 හා මෙම පිඹුරේ කැබලි අංක 07 හා 05; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 05 හා 04.

03 - 355

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2007 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1528/14 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පලකරන ලද 2007 අංක 392 දරන ආඥාවෙන් මෙහි පහත 1 වැනි උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 2 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: එල්ඩී/05/2007/යූඩීජී/218.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: නා/ඉ/1/අත්/2005/1.
2013 පෙබරවාරි මස 13 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපළාත සුළු කොට්ඨාසයේ, පහළ කටුනේරිය ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කර ඇති මු.පි.පු. 4574 හා 2008.07.22 දිනැති මූලික පිඹුරේ සඳහන් කැබලි අංක 1 හා 2 වශයෙන් සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.607 ක් වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 1 – කෝන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.098**
උතුරට: මු.පි.පු. 3744 හි කැබලි අංක 148, මාර්ග (මා.සං.අ.) සහ හිපි 40391 එම්. ස්ටැන්ලි ප්‍රනාන්දු සහ තවත් අය හිමිකම් කියන කෝන්ගහවත්ත; නැගෙනහිරට: මෙම පිඹුරේ කැබලි අංක 2; දකුණට: හිපි 40391 කේ. මේරි බ්‍රිජට් ප්‍රනාන්දු සහ සමගි දේපල වෙළෙඳාම් (පුද්ගලික) සමාගම හිමිකම් කියන කෝන්ගහවත්ත සහ මු.පි.පු. 3744 හි කැබලි අංක 61 මාර්ග (මා.සං.අ.); බටහිරට: මු.පි.පු. 3744 හි කැබලි අංක 61 මාර්ග (මා.සං.අ.).

02. **කැබලි අංක 2 – කෝන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.509**
උතුරට: හිපි 40391 එම්. ස්ටැන්ලි ප්‍රනාන්දු සහ තවත් අය, එම්. සිතාරා කාන්ති, මේරි ප්‍රනාන්දු සහ ස්ටැන්ලි පිලිප් හිමිකම් කියන කෝන්ගහවත්ත); නැගෙනහිරට: මාර්ගය; දකුණට: හිපි 40391 සමගි දේපල වෙළඳාම් (පුද්ගලික) සමාගම හිමිකම් කියන කෝන්ගහවත්ත; බටහිරට: හිපි 40391 කේ. මේරි බ්‍රිජට් ප්‍රනාන්දු සහ සමගි දේපල වෙළෙඳාම් (පුද්ගලික) සමාගම හිමිකම් කියන කෝන්ගහවත්ත, මෙම පිඹුරේ කැබලි අංක 1 සහ හිපි 40391 එම්. ස්ටැන්ලි ප්‍රනාන්දු සහ තවත් අය හිමිකම් කියන කෝන්ගහවත්ත.

03 - 357

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1979 නොවැම්බර් මස 23 වැනි දින අංක 64 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 1979 අංක 610 දරන ආඥාවේ සඳහන් කැබලි අක්ෂර "අ" සිට "ඊ " දක්වා සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: 03ජේ/78/ඊ/262.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:ඩීඑස්/ජීඑෆ්ජී/එල් ස එල්/5/66/248.
2013 පෙබරවාරි මස 13 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, දංගෙදර ගමේ පිහිටි, ගාල්ල කොට්ඨාස සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගා./629 සහ 1982.07.19 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 14 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් පර්. 18.8 ක් වූ පහත සඳහන් බිම් කොටස:

01. **කැබලි අංක 14 – දොරවල, කනුවල අගබොඩ, බෙරව ඉන්නවත්ත අද්දර ඕවිට හෙවත් පොල් කොරටුව, වරි. අංක 54 ස්ටීල් පාර – ප්‍රමාණය: පර්. 18.8**

උතුරට: ස්ටීල් පාර, කැබලි අංක 15 සහ 12; නැගෙනහිරට: කැබලි අංක 12, 10 සහ 13; දකුණට: කැබලි අංක 13; බටහිරට: ස්ටීල් පාර සහ කැබලි අංක 15.

03 - 358

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2012 අංක 268 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/9/2011/ඩබ්එස්/141.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: යනු/ඉ/ජලවහා/14.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට යටත්ව අංක 1782/30 හා 2012.10.31 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ පළ කරන ලද 2012 අංක 268 දරන ආඥාවේ ඉඩමේ විස්තරය යටතේ සඳහන් ''අංක Maha/YN//2012/381P හා 2012.05.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් '' යන්න ඉවත්කොට ඒ වෙනුවට ''අංක Maha/YTN//2011/381P '' හා 2012.05.18 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සඳහන් '' යන්න ආදේශ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 13 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 356

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.